# කිසියම් මාතෘකාවක් මත වාද්‍ය ඛණ්ඩයක් නිර්මාණය කිරීම

කිසියම් මාතෘකාවක් මත වාද්‍ය ඛණ්ඩයක් නිර්මාණය කිරීමේදී එම මාතෘකාවේ ඇති ස්වභාවය පිළිබඳ පළමුව සිතා බැලිය යුතුය. නිදසුනක් ලෙස පහත සඳහන් මාතෘකා දෙස බලන්න.

01 - දුම්රියක ගමන

02- වැස්ස

03 - මුහුද

02 - දිය ඇල්ලක්

වැස්ස නැමති මාතෘකාව උදාහරණයක් ලෙස ගෙන බැලීමේදී

- වැස්සට පෙර පරිසරයේ ඇතිවන වෙනස්කම් ( සුළං හැමීම, කුරුල්ලන් කුඩුකරා යාම )
- සිහින් වැසි පොද පොළවට පතිත වීම
- කෙමෙන් වර්ෂාව වැඩිවීම (ගෙරවීම, අකුණු ගැසීම )
- ධාරාණිපාත වර්ෂාවක් දක්වා වැඩිවීම
- ක්‍රමයෙන් වැස්ස අඩුවීම
- සුළඟ සමඟ සිහින් වැහිබිඳු පොළවට පතිති වීම

ආදි සිදුවීම් රාශියක් දැකිය හැකිය. මෙසේ එක් එක් කරුණුවලට අදාලව සංගීත උපකරණ මඟින් හඬ හැසිරවීමෙන් තේමාවකට අදාල නව නිර්මාණයක් බිහිකළ හැකිය.

## පැවරුම්

01- කිසියම් තේමාවක් යටතේ සංගීත භාණ්ඩ උපයෝගී කොටගෙන සිදුකළහැකි නව නිර්මාණයක ක්‍රියාවලිය පිළිවෙලින් ලියා දක්වන්න

02- නව සංගීත නිර්මාණ කිරීම සඳහා යොදාගත හැකි මාතෘකා (තේමා) 05 ලියන්න

## ක්‍රියාකාරකම

එක සමාන වතුර වීදුරු 07 ගෙන පේලියට තබා ඉන් පළමු වීදුරුවට ජලය ටිකක් දමන්න. ඉන් පසුව දෙවැනි වීදුරුවට පළමු වීදුරුවට දැමූ ජලය ප්‍රමාණය මෙන් දෙගුණයක් දමන්න. තෙවැනි වීදුරුවට පළමු වීදුරුවට දැමූ ජලය ප්‍රමාණය මෙන් තුන් ගුණයක් බැගින් වීදුරු 07ට පුරවා කුඩා කෝටු කැබැල්ලකින් වීදුරු වලට තට්ටුකර බලන්න.